*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය 2021
# සිංහල භාෂාව හා සාහිත්‍යය

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

01 නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන

(i) 32 කි. (ii) 48 කි. (iii) 60 කි. (iv) 54 කි.

02 සඤ්ඤක අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) හ, ඹ, එ, ද (ii) ළ, ශ, ග, ඡ (iii) ඡ, ඬ, ඳ, ඹ (iv) ඤ, ඟ, ඦ, ඡ

03 උත්තම පුරුෂ බහු වචන අතීතකාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

(i) බැලුවෝය (ii) බැලුවෙමු (iii) බලමු (iv) බැලුවෙමි

04 උක්ත නාම පද පමණක් ඇති පිළිතුර තෝරන්න.

(i) ගවයෙකු, මුවෙක්, දරුවා (ii) ගුරුවරු, දූරියක්, මම

(iii) අප, ළමයෙක්, කොටියා (iv) මා, මිනිස්සු, අප

05 පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,

(i) 'අ' ය. (ii) 'උ' ය. (iii) 'සෘ' ය. (iv) 'පෞ' ය.

- **අංක 06 හා 07 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.**

06 (i) පරිච්ඡේදය (ii) වර්සඑලය (iii) අවබෝදය (iv) දක්ෂිණ

07 (i) දර්ශනය (ii) ආරම්බය (iii) සංකීර්න (iv) ප්‍රමානය

- **අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල සමානාර්ථ පදය තෝරා යටින් ඉරක් අඳින්න**

08 නිරිඳු

(i) තරිඳු (ii) භූපති (iii) දිනිඳු (iv) මලවි

09 පුෂ්පය

(i) කුසුම (ii) පියුම (iii) මළ (iv) කුමුදු

10 පණිඳා

(i) පැණිය (ii) නාගයා (iii) ගිජිඳා (iv) පනිට්ටුව

- **අංක 11 සිට 12 තෙක් ප්‍රශ්නවල විරුද්ධාර්ථ පදය තිත් ඉර මත ලියන්න.**

11 වැරදි - ......................................

12 දුදන - ......................................

- **අංක 13 හා 14 ප්‍රශ්නවල දී ඇති පදවලට ගැළපෙන විශේෂණ පදය සහිතව තිත් ඉරි මත නැවත ලියන්න.**

13 ගවුම - ...................................................... කොටියා - ..................................................

මිනිසා - ...................................................... පැන්සල - ..................................................

14 ඇඬුවාය - ...................................................... බලයි - ..................................................

දිව්වේය - ...................................................... නටති - ..................................................

- **අංක 15 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැනකට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

15 කඳු පෙළ ගම වටා පවුරක් සේ නැඟී ................................................................ (සිටිති / සිටියි / සිටින්නෝය)

16 ගව රංචුව තණ පිටිය හරහා .................................................................................... (ගියහ / යන්නේය / ගියේය)

17 .......................................................... කැදැල්ල සුව පහසුව සකස් කළාය. (කුරුල්ලා / කිරිල්ලිය / කුරුල්ලෝ)

18 ........................................................................................ සයුර කරා ගලා බසිති. (ගඟ / ගංගා / ගංගාවෝ)

19 වෛද්‍යවරු රෝගියා පරීක්ෂා .................................................................................. (කළහ / කළේය / කළාය)

20 පහත වාක්‍ය නිවැරදිව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.

අපුරුසුවඳඑකගෙඩියක්අරංකටෛතියලාරහබැලුවමමොකද

......................................................................................................................................................................

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- **01 හා 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) ජල සම්පත සුරකිමු

(ii) නිරෝගී දිවියක් සඳහා ආහාර පුරුදු

(iii) කෘෂි කර්මාන්තය දියුණු කරමු

(iv) පොතපත කියවමු දැනුම වඩමු

(v) අලුත් අවුරුදු උත්සවය (ලකුණු 18)

02 පහත අවස්ථා අතරින් <u>එකකට</u> පිළිතුරු සපයන්න.

(i) දුර බැහැර ප්‍රදේශයක ජීවත් වන තම හොඳම යාළුවා ගේ සුවදුක් විමසා පාසල් නිවාඩුවට තම නිවසට පැමිණෙන ලෙස ඉල්ලා යවන ලිපියක් ලියන්න.

(ii) ඔබේ හොඳම යහළුවා ජාත්‍යන්තර චිත්‍ර තරගයකින් ජයග්‍රහණය ලබා තිබේ. ඒ සඳහා සුබ පතා යවන සුබ පැතුම් පත සකස් කරන්න. (ලකුණු 12)

- **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පසු දින රණරාළ ඉවුම් පිසුම් සඳහා අවශ්‍ය භාජන ද වෙනත් බඩු රාශියක් ද බෝට්ටුවෙහි පටවා ගෙන දිවයිනේ අනික් පැත්ත බලා යාත්‍රා කළේය. ඊට මද වේලාවකට පසු පියදාස එළුවන් ගොඩින් දිවයිනෙහි අනික් පැත්තට ගෙන යාමට පිටත් විය. පහසුවෙන් ගෙන යා හැකි ඇතැම් භාණ්ඩ හිස පිට පටවා ගත් බිසෝමැණිකාත් ඔහු සමග ගියා ය. සමරවික්‍රම විමලාගේ ද ළමයින්ගේ ද ආරක්ෂාව සඳහා කුඩාරමෙහි නැවතුණේ ය. පියදාස හා බිසෝමැණිකාත් සමඟ තමාටත් යාමට ඉඩ දෙන්නැයි ඉල්ලා ශරත් හඬන්නට වූ නමුත් විමලා ඊට ඉඩ නුදුන්නා ය.

(i) බෝට්ටුවට පටවා ගත්තේ මොනවා ද?

(ii) එළුවන් දිවයිනේ අනික් පැත්තට ගෙන ගියේ කෙසේ ද?

(iii) හිසෙන් භාණ්ඩ ගෙන ගියේ කවුද?

(iv) සමරවික්‍රම නැවතුණේ ඇයි?

(v) හඬන්නට වූයේ කවුද? ඒ ඇයි?

(ලකුණු 2 x 5 = 10)

04 පහත දැක්වෙන අතීතකාල වාක්‍ය අනතීත කාලයට හරවා ලියන්න.

(i) අපි අටමස්ථානය වැඳපුදා ගත්තෙමු.

(ii) තොපි ගෙවත්ත පිරිසිදු කළෙහු.

(iii) කම්කරුවෝ මාර්ගය පිළිසකර කළහ.

(iv) ගෙවිලිය හේනට ගියාය.

(v) ගොවියා කුඹුරට ජලය හැරෙව්වේය. (ලකුණු 2 x 5 = 10)

05 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පහත ජාතක කතා ඇසුරෙන් ලියූ කාව්‍ය ග්‍රන්ථ ලියන්න.

ගුත්තිල ජාතකය -

සත්තුභත්ත ජාතකය -

(ii) කුරුණෑගල් පුර යුගයේ ලියවුණු පන්සිය පනස් ජාතක පොතේ අඩංගු වන්නේ කුමන කතා ද?

(iii) 'නරි නයිදේ රැවටිච්චි' පාඩමට ඇතුළත් ජනකතාව උපුටා ගත් පොතේ නම හා එහි සම්පාදකවරයාගේ නම ලියන්න.

(iv) මහනුවර ප්‍රදේශයේ ප්‍රචලිත පුරාවෘත්ති හා ජනකතා ඇතුළත් ග්‍රන්ථය කුමක් ද? එහි කතුවරයා කවුද?

(v) 'කියවන නුවණ' කෘතියෙන් උපුටාගන්නා ලද පාඩමේ නම කුමක් ද? එහි කතුවරයා කවු ද?

06 පහත පද්‍ය සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| (i) | දත් කැකුළු පෑලා | ................................................................. |
| | ........................................................... | කෙළී සියලඟ දූලිගාලා |
| (ii) | වැඩක නොයෙදූ සිත | නරක අතටම පෙරළෙන |
| | ........................................................ | .................................................................. |
| (iii) | ........................................................ | .................................................................. |
| | සිටුවා දොර දොර රඹතුරු | තබවා පුන් කුඹු විසිතුරු |
| (iv) | වනේ ගිජිදාය දුටුවොත් වනසාය | ළිඳේ පණිදාය වැටුණොත් උඟ කාය |
| | ........................................................ | ................................................................... |
| (v) | සසඳ සසඳ අපි හඳපානේ යනවා | මම්මල බඳට ගොන් බානක් දක්කනවා |
| | ........................................................... | ................................................................... |

(ලකුණු 2 x 5 = 10)

07 පහත සඳහන් ප්‍රකාශ උපුටාගත් පාඩම ප්‍රකාශ කළේ කවුද? කා හට ද? යන්න ලියන්න.

(i) ''අහෝ ! ඒ සතාගේ දිග ; මහත.''

(ii) දිය ඇති තැනකට මාත් එක්ක යන්න බැරිද?

(iii) ''හනික, හනික, බලා ඉන්නට කල් නෑ''

(iv) ''කිමෙක් ද? දරුවෙනි, පැන් නොබොව් දූ''

(v) ''අම්මව එක්ක යන්නේ මම ය.'' (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) (iii) (02) (iii) (03) (ii) (04) (ii) (05) (i) (06) (iv) (07) (i) (08) (ii) (09)(i)
(10) (ii) (11) නිවැරදි (12) සුදන (13) නාම පදයට ගැළපෙන පරිදි විශේෂණ පද ලියා ඇතිනම් අදාළ ලකුණු පිරිනමන්න. (14) ක්‍රියා පදයට උචිත පරිදි විශේෂණ පද ලියා ඇත්නම් අදාළ ලකුණ පිරිනමන්න. (15) සිටියි (16) ගියහ (17) කිරිල්ලිය (18) ගංගාවෝ (19) කළහ
(20) අපූරු සුවඳ ! එක ගෙඩියක් අරං කටේ තියලා රහ විතරක් බැලුව ම මොකද? (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 කරුණු සඳහා - 6 සංවිධානාත්මක බව ආදිය සඳහා - 8 ශිල්පීය දක්ෂතා - 4 මුළු ලකුණු - 18 ( සුදුසු පරිදි ලකුණු පිරිනමන්න)

02 ආකෘතිය - 3 අඩංගු කරුණු - 7 ශිල්පීය දක්ෂතා - 2 මුළු ලකුණු - 12 (සුදුසු පරිදි ලකුණු පිරිනමන්න)

03 (i) ඉවුම් පිහුම් සඳහා අවශ්‍ය භාජන හා වෙනත් බඩු
(ii) ගොඩබිමෙන් / ගොඩින්
(iii) බිසෝමැණිකා
(iv) විමලාගේ හා ළමයින්ගේ ආරක්ෂාවට
(v) ශරත් - තමාටත් යාමට ඉඩ දෙන මෙන් ඉල්ලා (ලකුණු 2 x 5 = 10)

04 (i) අපි අටමස්ථානය වැඳ පුදා ගමු / ගනිමු
(ii) තොපි ගෙවත්ත පිරිසිදු කරහු
(iii) කම්කරුවෝ මාර්ගය පිළිසකර කරති / කරන්නෝය
(iv) ගෙවිලිය හේනට යයි / යන්නිය
(v) ගොවියා කුඹුරට ජලය හරවයි / හරවින්නේය ( ලකුණු 2 x 5 = 10)

05 (i) ගුත්තිල කාව්‍ය, කාව්‍යශේකරය
(ii) බුදුරජාණන් වහන්සේ ගේ පූර්ව ජන්මයන් පිළිබඳ කතා
(iii) වටු කිරිල්ලි හා තවත් කතා, ඒ.පී.ගුණරත්න
(iv) මඟදිගට ජන කතා, ඩී.පී වික්‍රමසිංහ
(v) අලි උවදුර, කුමාරතුංග මුණිදාස මහතා (ලකුණු 2 x 5 = 10)

06 (i) සුරතල් සිනා සීලා බොළඳ බස් දීලා
(ii) කිමෙක වන යහපත වැඩක එබැවින් යොදනු තම සිත
(iii) සදවා සුදු වැලි පිවිතුරු බඳවා රන් දද පියකරු
(iv) අතකින් කරවැලකි අතකින් දඬුබෑය මරණ තුනක් ඇති මිනිසෙක් පැණි කෑය
(v) සත්සිය සගවුවට රෝදේ කැරකෙනවා දත් කැකුළකට අපි කුරුණෑගල යනවා
(ලකුණු 2 x 5 = 10)

07 (i) අලි උවදුර අලියා තමාට ම
(ii) නරිනයිදේ රැවටිච්චි ඉබ්බා කොක්කු දෙදෙනාට
(iii) චීචෙං චූලංගෙං යමු කිරි නැනෝ පොරමොලා ගමා හා කයිරාට
(iv) නලපාත ජාතකය වඳුරු රජු / වානර නායකයා / බෝධිසත්වයෝ / වඳුරු රංචුවට / වානර සේනාවට
(v) ක්‍රියා පද හා එහි ප්‍රභේද / ශරත් / පියදාසට (ලකුණු 2 x 5 = 10)